# මාධ්‍ය නිවේදනය
# ஊடக வெளியீடு
# Press Release

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

අංකය / எண் / No. CEB/2024/MR/016

දිනය / திகதி / Date 2024 දෙසැම්බර් 20

සියලුම විද්‍යුත්, මුද්‍රිත වෙබ් පදනම් කරගත් මාධ්‍ය ආයතන,
ප්‍රධාන සංස්කාරක / ප්‍රවෘත්ති සංස්කාරක
අධ්‍යක්ෂ (ප්‍රවෘත්ති) / ප්‍රවෘත්ති කළමණාකරු, වෙබ් සංස්කාරක,

හිතවත් මහත්මයාණෙනි/ මහත්මියණි,

## අනවසර ලෙස විදුලි සැපයුම භාවිත කිරීම නිසා රටට අහිමි වී යන වන අලි සම්පත රැක ගනිමු

අප රටේ ජෛව විවිධත්වයේ සංකේතයක් වූ වන අලි සම්පත දිනෙන් දින මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් වඳවී යාමේ තර්ජනයකට ලක්ව ඇත. එහිදී ගණනය කිරීම් වලට අනුව 2024 වසර තුළ මේ දක්වා පමණක් ලංවිම විදුලි සැපයුම අනවසරයෙන් වැටවල්වලට හෝ රැහැන්වලට සම්බන්ධ කිරීම මඟින් අලි 50 දෙනෙකු පමණ මරණයට පත්වී ඇති බව වාර්තා වී ඇත.

ලංකා විදුලිබල මණ්ඩලය මෙම නීති විරෝධි ක්‍රියාව සම්බන්ධයෙන් දැනටමත් සුදුසු විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර අප රටේ වන අලි සම්පත රැක ගැනීමට ජනතා සහායද අපේක්ෂා කරමු. ඒ අනුව විදුලි සැපයුම අනවසරයෙන් වැටවල්වලට හෝ රැහැන්වලට සම්බන්ධ කිරීම් පිළිබඳව 0112 118 767 දුරකතන අංකය ඔස්සේ හෝ අපගේ හදිසි ඇමතුම් අංකය වන 1987 දුරකථන අංක ඔස්සේ වහාම ලංකා විදුලිබල මණ්ඩලය දැනුවත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

අතීතයේ සිටම ආගමික මෙන්ම සංස්කෘතික වශයෙන් වැදගත්කමක් උසුලන, දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ෂණය සහ ආදරයට ලක් වෙමින් රට තුළ ආර්ථිකය ශක්තිමත් කිරීමට දායකත්වය සපයන වන අලි සම්පත රැකගැනීමට ඔබට අප හා එක්වන්නට ආරාධනා කර සිටිමු.

මෙයට විශ්වාසී,
**ලංකා විදුලිබල මණ්ඩලය**

ඉංජිනේරු. A.D.K. පරාක්‍රමසිංහ
මාධ්‍ය ප්‍රකාශක

මාධ්‍ය අංශය, ලංකා විදුලිබල මණ්ඩලය,
නො. 50, සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 00200, ශ්‍රී ලංකාව
e : media@ceb.lk